(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 21.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 අගෝස්තු මස 19 වැනි බදාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0068/'09

1.

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්තමානයේදී රජයේ ගුවන් විදුලි විකාශන ආයතන සහ පුද්ගලික සමාගම්වලට ගුවන් විදුලි විකාශනය සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවද දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ නියාමනය වී ක්‍රියාත්මක වන්නක් වන බැවින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම අනෙක් බලපත්‍රලාභීන්ට හා අයදුම්කරුවන්ට අසාධාරණයක් වන අතර සාධාරණ වෙළඳාම හා සම අවස්ථා සැලකීමේදී ලෝක වෙළඳ සංවිධානය (W.T.O.) සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමග අත්සන් කරන ලද ගිවිසුම් උල්ලංඝණය කිරීමක්ද වන බව ගරු අමාත්‍යතුමා දන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වර්තමානයේදී ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීමට යොදා ගැනෙන දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ අදාළ විධිවිධාන අවලංගු කර එම විධිවිධාන දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ හෝ ඒ හා සමාන පනතක් යටතේ යළි හඳුන්වා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0087/'09

2.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන රජයේ, ආරක්ෂක අමාත්‍යවරයාගේ ධූර කාලය තුළ පොලිස් අත්අඩංගුවට පත්ව සිටියදී මිය ගොස් ඇති සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී සැකකරුවන්ගේ නම් කවරේද;

(iii) ඒ ඒ සැකකරුවන් මියගොස් ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0193/'09

3.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2009 අයවැයෙන් ධීවර ක්ෂේත්‍රය සඳහා වෙන්කර තිබෙන මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිරිදිය ධීවර කර්මාන්තය සඳහා වෙන්කර තිබෙන මුදල කොපමණද;

(ii) ඉස්සන් වගාව සඳහා වෙන්කර තිබෙන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) "මිහින් ලංකා" ගුවන් සේවයට 2009 අයවැයෙන් මිලියන හය දහසක් වෙන්කර තිබෙන තත්ත්වයක් තුළ, ධීවර ක්ෂේත්‍රයට වෙන්කර තිබෙන මුදල ප්‍රමාණවත් නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0256/'09

4.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක රජයේ පාසල්, පිරිවෙන් හා පෞද්ගලික පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් ඒවා නම් වශයෙන් කවරේද;

(iii) ඉහත රජයේ පාසල් හා පිරිවෙන් සඳහා අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව හා දැනට සිටින ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ රජයේ පාසල් හා පිරිවෙන් අතුරින් මේ වන විට වසා දමා ඇති සංඛ්‍යාව අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් කොපමණද;

(ii) එම පාසල් හා පිරිවෙන් වසා දමන ලද්දේ කවර වර්ෂවලදී ද;

(iii) ඒවා එලෙස වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) කවර හෝ හේතුවක් නිසා වසා දැමීමට නියමිත වූ පාසල් හා පිරිවෙන් වසා දැමීමෙන් වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේනම් එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0263/'09

5.

ගරු බිමල් රත්නායක මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය මගින් "ගජ මිතුරෝ" නමැති ව්‍යාපෘතියක් ආරම්භකර තිබේද;

(ii) එම ව්‍යාපෘතියේ අරමුණ කවරේද;

(iii) විදුලි වැටවල් ඉදිකිරීම සඳහා "ගජ මිතුරෝ" ව්‍යාපෘතිය කොපමණ මුදලක් වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය මගින් ආරම්භ කර ඇති වෙනත් ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) වෙන් වෙන් වශයෙන් ඒවා කවරේද;

(iii) දැනට අවසන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවා කවරේද;

(iv) සාර්ථකවී ඇති ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවා කවරේද;

(v) මෙම ව්‍යාපෘති සඳහා වියදම් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0378/'09

6\.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(2)

(අ) නෙදර්ලන්ත රජය විසින් ශ්‍රී ලංකාවට ලබාදෙන සියලු ආධාර සම්පූර්ණයෙන්ම නවතා ඇති බවට නෙදර්ලන්ත පාර්ලිමේන්තුව තුළ, එරට රජය වෙනුවෙන් අමාත්‍යවරයෙකු ප්‍රකාශ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම ආධාර නවතා දැමීමට හේතුව, ශ්‍රී ලංකාව තුළ සිදුවන උග්‍ර මානව හිමිකම් උල්ලංඝණය වීම, සිවිල් ජනතාවගේ මරණ සහ නීතියේ උත්තරීතරභාවය පලුදු කිරීම බව එම ප්‍රකාශයේ සඳහන් වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නෙදර්ලන්ත රාජ්‍යය සමග නැවත යහපත් සම්බන්ධතා ගොඩනඟා ගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0388/'09

7\.

ගරු සාගල රත්නායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතියේ, නොරොච්චෝලේ ගල් අඟුරු ව්‍යාපෘතියේ සහ කෙරවලපිටිය බහු චක්‍රීය බලාගාරයේ මෙගා වොට් එකකට ප්‍රාග්ධන පිරිවැය (මිල දී ගැනීම් හා තැනීම් සඳහා වූ මූලධන වියදම) නවතම මිල ඉහළ නැගීම්ද සමග වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කැළණිතිස්ස පිහිටි ලං. වි. ම. ට අයත් බහු චක්‍රීය බලාගාරය;

(ii) ඒඊඑස් (AES) ට අයත් බහු චක්‍රීය බලාගාරය;

(iii) කෙරවලපිටිය බහු චක්‍රීය බලාගාරය- බහු චක්‍රීය ක්‍රමයට සහ ඒක චක්‍රීය ක්‍රමයට;

(iv) යාපනයේ පිහිටි පෞද්ගලික අංශයට අයත් අයිපීපී (IPP) බලාගාරය සහ අනෙකුත් සියලුම අයිපීපී (IPP) බලාගාර;

(v) යාපනයේ පිහිටි තාවකාලික ඇග්‍රෙකෝ බලාගාරය;

(vi) ලං. වි. ම. ට අයත් හියට් වායු ටර්බයිනය;

යන එක් එක් බලාගාරයේ ඉන්ධන යෙදවුම සහ ව්‍යාපෘතියේ සම තීරුබදු වල ඇස්තමේන්තුගත ඒකක පිරිවැය එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කෙරවලපිටිය ව්‍යාපෘතිය සඳහා ඔවුන් විසින් ලබාගත් ණය සඳහා සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් සමාගම විසින් එකඟවන ලද පොලී පිරිවැයද (අනුපාතිකය) එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0515/’09

8.

ගරු ජයන්ත විජේසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ඇති සියලුම පාසල් සඳහා අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල මේ වනවිට සිටින ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත දිස්ත්‍රික්කය තුළ මේ වනවිට ඇති ගුරු පුරප්පාඩු සංඛ්‍යාව ඒ ඒ විෂයයන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඉහත එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0070/’09

9.

ගරු රවි කරුණානායක මහතා,—ජනමාධ්‍ය සහ තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ දෙක තුළ මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද සියලුම රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන බලපත්‍ර පිළිබඳ විස්තර එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම බලපත්‍ර නිකුත් කරන ලද්දේ ටෙන්ඩර් පදනමකින්ද;

(ii) ඒ සඳහා අනුගමනය කරන ලද කාර්ය පටිපාටිය කවරේද;

(iii) එම එක් එක් බලපත්‍රය නිකුත් කිරීම මගින් උපයා ගනු ලැබූ ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0088/’09

10.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නගර සංවර්ධන සැලැස්මකට අනුව වැඩ අවසන් කළ නගරයක් හෝ නගර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර නගරද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නගර සංවර්ධන සැලැස්මේ කටයුතුවලට අනුව 50% කින් වැඩ අවසන් කළ නගරයක් හෝ නගර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර නගරද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0207/'09

11.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 අයවැයෙන් ධීවර ජනතාවට සහන ලබා දී තිබේද;

(ii) එම සහන කවරේද;

(iii) එම සහන ක්‍රියාත්මක වන්නේ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0264/'09

12.

ගරු බිමල් රත්නායක මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් 2000 වසරේ සිට ආරම්භ කර ඇති විදුලි වැට ඉදිකිරීමේ ව්‍යාපෘති පිළිබඳ විස්තරයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට "ගජ මිතුරෝ" ව්‍යාපෘතිය බාර නොදුන්නේ කවර හේතු නිසාද;

(ii) "ගජ මිතුරෝ" ව්‍යාපෘතිය තුළ අලි ඇතුන්ගේ ආහාර, ජලය, ලවණ ආදී අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, ඉහත අවශ්‍යතාවයන් සඳහා කුඩා වැව් ඉදිකිරීම අදාළ ව්‍යාපෘතිය මගින් හඳුනාගෙන තිබේද;

(iv) ඒ සඳහා වෙන් කළ මුදල හා මෙතෙක් ඉදිකර ඇති කුඩා වැව් සංඛ්‍යාව පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0208/'09

13.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ කොපමණ වැව් හා ජලාශ ප්‍රමාණයක මත්ස්‍ය වගා කටයුතු ආරම්භකර තිබේද;

(ii) ඒ කවර වැව් හා ජලාශවලද;

(iii) ඒවායේ වගා කළ මසුන් වර්ග කවරේද;

(iv) එම වැව් හා ජලාශවල මත්ස්‍ය වගාවේ නිෂ්පාදනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0266/'09

14.

ගරු බිමල් රත්නායක මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයට මාසික කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර කාර්යයක් සඳහාද;

(iii) ඒ ඒ ගොඩනැගිලි සඳහා ගෙවන මාසික කුලිය වෙන වෙනම කොපමණද;

(iv) එම ගොඩනැගිලිවල අයිතිකරුවන් කවුරුන්ද;

(v) එම ගොඩනැගිලි ලබා ගන්නේ කවර ආකාරයටද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) දෙහිවල, ගාලුපාර, අංක 04 දරන ලිපිනයෙහි පිහිටා ඇති ගොඩනැගිල්ල කවර ආයතනය සඳහා මිලදී ගෙන තිබේද;

(ii) ඒ කවර වර්ෂයේ සිටද;

(iii) එහි මාසික කුලිය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,—කැළෑ (සංශෝධන),— කැළෑ ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,—පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන),— 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 5.30 දක්වා විය යුතු ය. අ. භා. 3.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 119— වැඩසටහන 2,— † 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දෙදහස් හාරසීයකට (රු. 2,400,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 119 | — | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන් | |
| | | | මූලධන වියදම් | රු.2,400,000,000 |
| | | | | රු.2,400,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 අගෝස්තු මස 06 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 10 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 9 දක්වා එකතුව රුපියල් 16,445,510,000.

*2.

සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*12.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*13.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*15.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*16.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*18.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*19.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*27.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*28.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

29.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

30.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.

වාරියපොල රාජමහා විහාර සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

32.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

සෙරෙන්ඩිබ් අධ්‍යාපනික භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

35.

ඉදිරි ලෝකය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.